අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

අ.පො.ස.(උසස් පෙළ) උපකාරක තක්සේරුව - **2026**

| ගෘහ ආර්ථික විද්‍යාව | 28 | S | 11 | කාලය පැය 3 |
|---|---|---|---|---|

- **අමතර කියවීම් කාලය - මිනිත්තු 10 කි.**
- අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදි ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමට යොදා ගන්න.

• **උපදෙස් - පළමුවන ප්‍රශ්නය** ඇතුළුව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

1 (i) රංගිරි දඹුලු විහාරය සහ සීගිරිය අයත් වන දිස්ත්‍රික්කය සහ පළාත පිළිවෙලින් සඳහන් කරන්න.
 (ii) නිවසකට විදුලිය සැපයීමේදී, සැපයුම් අධිකාරිය විසින් සවි කරනු ලබන උපාංග **දෙකක්** නම් කරන්න.
 (iii) සම්පූර්ණ ප්‍රෝටීන් හඳුන්වන්න.
 (iv) විටමින් සහ ඛනිජ ශරීරයට අවශෝෂණය කිරීම අඩු වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න.
 (v) ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත වෙනත් කර්මාන්ත **දෙකක්** ලියන්න.
 (vi) පුනර්ජනිත කෙඳි වර්ග **දෙකක්** නම් කරන්න.
 (vii) **මිල් සහ මොරිසන්ට** අනුව සංචාරක ආකර්ෂණ ආකාර **දෙකක්** නම් කරන්න.
 (viii) "ස්වභාවික සම්පත්" හඳුන්වන්න.
 (ix) ආයතනයක, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමේ අරමුණු **දෙකක්** ලියන්න.
 (x) මානසික පීඩනයේ දී, පෙන්නුම් කරන ප්‍රජානන ලක්ෂණ දෙකක් ලියන්න.

(මුළු ලකුණු 2x10=20)

2. (i) ප්‍රශස්ත ජීවන පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම කරුණු **තුනකින්** සඳහන් කරන්න. (ලකුණු 3).
 (ii) වැසි ජල සංරක්ෂණයෙන් නිවසකට ලැබෙන ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 3)
 (iii) පැහැදිලි කරන්න.
  (a) ඒකමිතිය
  (b) සමෝධානය (ලකුණු 4)
 (iv) පහත සඳහන් විදුලි උපකරණවල **ශක්ති පරිවර්තනය** සටහන් කර, ඒවා **නඩත්තු** කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
  (a) රෙදි සෝදන යන්ත්‍රය
  (b) බත් පිසිනය (ලකුණු 6)

(මුළු ලකුණු 16)

3. (i) "දුෂ්පෝෂණය" හඳුන්වන්න. (ලකුණු 3)
 (ii) ශරීරයට යකඩ හිඟවීම නිසා ඇතිවිය හැකි ඌනතා රෝග ලක්ෂණ **හතරක්** දක්වන්න. (ලකුණු 4)
 (iii) පහත සඳහන් ආහාර ද්‍රව්‍ය පිසීමේදී /රත් කිරීමේදී සිදුවන නිරීක්ෂණය කළ හැකි විපර්යාස සඳහන් කරන්න
  a) සීනි - (වියළි තාපය)
  b) මස් - (තෙත් තාපය) (ලකුණු 4)
 (iv) මන්ද පෝෂණයෙන් පෙළෙන පෙර පාසල් වියේ දරුවකු සඳහා දිනක බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 5)

(මුළු ලකුණු 16)

4 (i) සුබ්‍රිකරණය (Blanching) හඳුන්වා, එහි ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 3)

(ii) ආහාර පරිරක්ෂණයේ දී යොදා ගන්නා "දුම් ගැසීම" පැහැදිලි කර, එමගින් සකස් කළ ආහාර **දෙකක්** නම් කරන්න. (ලකුණු 3)

(iii) නිෂ්පාදනයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ දී ව්‍යවසායකයෙකු ලෙස ඔබ අනුගමනය කළ යුතු බාහිර ආචාර ධර්ම **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 4)

(iv) කෙටි සටහන් ලියන්න.

a. එළවළු වියළන ක්‍රියාවලිය

b. අධිශීතනය (ලකුණු 6)

(මුළු ලකුණු 16)

5.

I. ඇඳුම් සඳහා "පතරොම් නිර්මාණය කිරීම" කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)

II. නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක සිදු කෙරෙන ක්‍රියාවලිය, අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 4)

III. පොලිමර්, කෙඳි බවට පත් කිරීමේ ක්‍රමයක් ලෙස "ද්‍රව කැටීම" හඳුන්වන්න. (ලකුණු 4)

IV. දික් දාර වියමනෙහි දළ රූප සටහනක් ඇඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(මුළු ලකුණු 16)

6.

i. "සම්පත් අවභාවිතය" හඳුන්වන්න. (ලකුණු 2)

ii. ස්වභාවික සම්පත් හිඟවීම හෝ විනාශ වීම නිසා ඇතිවිය හැකි අහිසි බලපෑම් **හතරක්** නම් කරන්න. (ලකුණු 4)

iii. ප්‍රධාන දේශගුණික විපර්යාස **දෙකක්** නම් කර ඒවා ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 4)

iv. සංචාරක කර්මාන්තයේ සංවිධානය සහ ව්‍යුහයට ඇතුළත් වන විවිධ අංග **හතරක්** නම් කර ඉන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

(මුළු ලකුණු 16)

7.

I. නව යොවුන් වියේ දරුවාගේ සදාචාර වර්ධනයට බලපෑම් ඇති කරන කණ්ඩායම් කවරේද? (ලකුණු 2)

II. නව යෞවනයා මුහුණ දෙන අධ්‍යාපන ගැටළු කෙරෙහි බලපාන සාධක ලැයිස්තුගත කරන්න. (ලකුණු 4)

III. "යොවුන් විය, බුද්ධි සංවර්ධනයේ කැපී පෙනෙන අවධියකි." සාකච්ඡා කරන්න. (ලකුණු 4)

IV. යෞවනයාගේ මානසික ගැටළු අවම කර ගැනීමට පාසල තුළ සංවිධානය කළ හැකි සංස්කෘතික ක්‍රියාකාරකම් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

(මුළු ලකුණු 16)

8. පහත දැක්වෙන මාතෘකා අතරින් **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ගොඩනැගිල්ලක බාහිර පරිසරය සැකසීම සඳහා හැඩතල නිර්මාණය

ii. ශරීර ස්කන්ධ දර්ශකය

iii. කැඳහරණය

iv. සංචාරක කර්මාන්තයෙහි නේවාසික පහසුකම්

v. යෞවනයාගේ සිත සන්සුන් කිරීමේ අභ්‍යාස

(ලකුණු 4 x4 = 16)